ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය எனது இல. My No.	ඔබේ අංකය உமது இல. Your No.	දිනය திகதி Date 2024.09.28

ඒ.අයි.තිලකරත්න මයා
අක්කර 150 ජනපදය,
හල්වතුර,
බුලත්සිංහල.

පැමිණිලි පාර්ශවය

1. ප්‍ර.පො. ප චන්දන විදානගමගේ මයා
   පොලිස් ස්ථානය,
   බොරැල්ල.
   (2024.06.16 දින බුලත්සිංහල
   පොලිස් ස්ථානයේ ස්ථානාධිපති)

2. උ.පො.ප කසුන් ගන්කේවල
   පොලිස් ස්ථානය,
   කන්කසන්තුරය.
   (දූෂණ මර්ධන අංශ ස්ථානාධිපති-
   බුලත්සිංහල පොලිස් ස්ථානය)

3. පො.සැ 60040 අනුරුද්ධික මයා
   පොලිස් ස්ථානය
   බුලත්සිංහල

4. පො.කො102191 තරංග මයා
   පොලිස් ස්ථානය
   බුලත්සිංහල

5. පො.කො. 104236 ලියනගේ මයා
   පොලිස් ස්ථානය
   බුලත්සිංහල

වගඋත්තර පාර්ශවය

<u>පැමිණිලි අංකය- **HRC/HO/2876/24**</u>

ප්‍රධාන කාර්යාලය பிரதான அலுவலகம் Head Office	අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04. இல. 14, ஆர். ஏ. த. மெல் மாவத்தை, கொழும்பு 04. No. 14, R. A. De Mel Mawatha, Colombo 04.	සභාපති தவிசாளர் Chairman	011 - 250 5451
		ෆැක්ස් தொலைநகல் Fax	011 - 250 5541/74
		ඊමේල් மின்னஞ்சல் E-mail	sechrcsl@gmail.com
දුරකථනය தொலைபேசி Telephone	94-11-2505580 / 81 / 82	ලේකම් செயலாளர் Secretary	011 - 250 5521
		ක්ෂණික துரித அழைப்பு Hotline	1996
		වෙබ් இணையம் Web	www.hrcsl.lk

පැමිණිල්ල

ඒ. ඉෂාන් තිලකරත්න යන අය විසින් 2024.06.25 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින්, 2024.06.16 වන දින ඔහු රැකියාව නිමවා නිවස බලා යමින් සිටියදී, තම ගම් ප්‍රදේශයට ගමන් කරමින් තිබූ යතුරුපැදියක ඔහු හඳුනන මාමාවරුන් දෙදෙනකු සිටි බැවින් එම යතුරු පැදියට නැගී ගිය බවත්, එම අවස්ථාවේ දී කෝන්ගස්තැන්න හන්දිය ප්‍රදේශයේදී, පසුපසින් යතුරුපැදියකින් පැමිණි බුලත්සිංහල පොලිස් ස්ථානයට අනුයුක්ත නිලධාරීන් දෙදෙනෙකු විසින් ඔවුන්ට නතර කිරීමට නියෝග කළ බවත්, යතුරු පැදියේ ගමන්ගත් එම දෙදෙනා පලා ගිය බවත් තමා එහි නතර වූ බවත්, පලා ගිය එක් අයකු අල්ලා ගත් බව සඳහන් කර ඇත. එම අවස්ථාවේ දී එක් නිලධාරියෙකු පැමිණිලිකරුට අසභ්‍ය වචනයෙන් බැණ වැදී, ඔහුගේ කමිස කොළරයෙන් අල්ලා මාංචු දැමූ බවත්, අත්අඩංගුවට ගැනීමට හේතුව විමසූ විට "*පොලිසියේදී එය දැනගත හැකි*" බව පවසා අතින්, පයින් සහ හෙල්මට් එකකින් පහර දුන් බවත් සඳහන් කර ඇත. මෙම සිදුවීම එම ස්ථානයේ එළවළු කඩකාමරය හිමි රත්නසිරි මාමා දැක පහර නොදෙන ලෙසත් පහරදීමෙන් මිය යා හැකි බව සඳහන් කළ බවත් සඳහන් කර ඇත.

පොලිස් ස්ථානය වෙත රැගෙන ඒමෙන් අනතුරුව පැමිණිලිකරුව අපරාධ අංශයේ කාමරයක් වෙත යොමු කර, සිවිල් ඇඳුමින් සැරසී සිටි '*කසුන්*' නැමැති නිලධාරියා විසින් ඔහුව දණගස්වා ක්‍රිකට් පිත්තක් භාවිතා කරමින් පිට ප්‍රදේශයට සහ යටිපතුල්වලට පහර දුන් බව සඳහන් කර ඇත. මෙම පහරදීමෙන් වින්දිතයාගේ වම් ඇසට ලේ ගලා තිබූ බවත්, කම්මුල්, කන් ප්‍රදේශය සහ දණහිස්වලට ද තුවාල වූ බව සඳහන් කර ඇත. පහරදීමෙන් අනතුරුව අත්විලංගු ගලවා ඔහුව සිරමැදිරියට ඇතුළත් කර, පසුදින එනම් 2024.06.17 වන දින උදෑසන මූලික තොරතුරු විමසා පොලිසිය විසින්ම සකස් කරන ලද ලේඛනයකට බලහත්කාරයෙන් අත්සන් ලබාගත් බවයි. පසුව එදින පස්වරු 02.00ට පමණ පොලිස් ඇප මත මුදාහැර ඇති අතර 2024.06.19 වන දින මතුගම මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ පෙනී සිටින ලෙසට නියෝග කළ බවයි.

පොලිස් භාරයෙන් මුදාහැරීමෙන් පසු දැඩි ශාරීරික වේදනාවෙන් හේතුවෙන්, හොරණ මූලික රෝහලේ 07 වන වාට්ටුවට ඇතුළත් වී නේවාසිකව ප්‍රතිකාර ලබා අධිකරණ වෛද්‍ය නිලධාරීවරයාගේ පරීක්ෂාවට ලක්ව ඇති බව ද අනාවරණය වේ. වින්දිතයා රෝහල්ගතව සිටියදී 2024.06.18 වන දින ඔහුගේ මව පොලිස් ස්ථානයට ගොස් මෙම පහරදීම පිළිබඳව විරෝධය පළ කළ අවස්ථාවේදී, ස්ථානාධිපතිවරයා ප්‍රකාශ කර ඇත්තේ වින්දිතයාට එරෙහිව නඩු පැවරීමක් සිදු නොකරන බැවින් ඔහුට අධිකරණයට ඉදිරිපත් වීමට අවශ්‍ය නොවන බවයි. කෙසේ වුව ද, වින්දිතයා සමඟ අත්අඩංගුවට ගත් ප්‍රභාත් නැමැත්තාට එරෙහිව නීති විරෝධී මත්පැන් සම්බන්ධයෙන් නඩු පවරා රුපියල් 9,000/- ක දඩයකට යටත් කර තිබූ නමුත් එහි තමාගේ නම සඳහන් කර නොතිබුණු බව සඳහන් කර ඇත. මෙලෙස කිසිදු පෙර වැරැද්දක් නොමැතිව තමා අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගෙන පහරදීමට කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූල හා නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස පැමිණිල්ල මඟින් අපේක්ෂිත සහනය ලෙස සඳහන් කර ඇත.

අධිකරණ වෛද්‍ය වාර්තාව (Judicial Medical Report)

වින්දිතයා 2024.06.18 වන දින අධිකරණ වෛද්‍ය නිලධාරීවරයා විසින් පරීක්ෂාවට ලක් කර ඇති අතර, එහිදී වින්දිතයා විසින් ලබා දෙන ලද කෙටි රෝග ඉතිහාසය සහ වෛද්‍යවරයා විසින් නිරීක්ෂණය කරන ලද තුවාල පිළිබඳ විස්තරය පහත පරිදි වේ.

අ. රෝගියා විසින් ලබා දෙන ලද කෙටි ඉතිහාසය

"මෙම සිදුවීම 2024.6.16 වන දින රාත්‍රී 8 ට "රත්නසිරිගේ" එළවළු කඩකාමරය ඉදිරිපිට කොන්ගස්තැන්න හන්දියේ දී සිදු වූ බව ඔහු කියා සිටී.

කිසිදු හේතුවක් නොමැතිව මිනිසෙකු ඔහු වෙත පැමිණ ඔහුට පහර දුන් බව ඔහු පවසයි. මෙම පහරදුන් පුද්ගලයා පොලිස් නිලධාරියෙකු බව ඔහු විශ්වාස කරයි.

ඔහුගේ වම් පැත්තේ කම්මුලට කිහිප වතාවක් විවෘත අත්ලකින් පහර දුන් බවත්, පසුව හිස්වැස්මක පිටුපසින් මුහුණේ වම් පැත්තට 3 වතාවක් පහර දුන් බවත් ඔහු කියා සිටී. පසුව ඔහුව මාංචු දමා පොලිස් ස්ථානයට ගෙන ගොස් ලී ක්‍රිකට් පිත්තක පැතලි පැත්තෙන් ඔහුගේ පිටුපස වම් පැත්තට 3 වතාවක් පහර දුන් බවත්, ඔහුගේ දණහිසට සහ යටිපතුල් වලටද පහර දුන් බවත් ඔහු පවසයි. පසුව ඔහුගේ මාංචු ඉවත් කර ඔහුව සිර මැදිරියක තබා 17 වන දින (පසුදා) උදෑසන ඔහුගේ මව විසින් ඇප මත මුදා හරින ලදී. "

ආ. තුවාල (Injuries)

1. වම් ඇසෙහි බාහිර ප්‍රදේශයේ සෙන්ටිමීටර 2x2ක ප්‍රමාණයෙන් යුත් අක්ෂි පටලයට යටින් සිදු වූ රුධිර වහනයක් (Sub conjunctival hemorrhage of 2x2 cm of the lateral part of the left eye).

2. වම් ඇසට පහළින් පිහිටි සෙන්ටිමීටර 1x2 ප්‍රමාණයේ ඕවලාකාර හැඩැති තැලීම් තුවාලයක්. එම තැලීමේ ඇතුළත දාරය වම් ඇසෙහි ඇතුළත කෙළවරට සෙන්ටිමීටර 1ක් පහළින් පිහිටා තිබුණි Contusion, oval in shape, of 1x2 cm, below the left eye. The medial border of the contusion is 1 cm below the inner canthus of the left eye)

3. දකුණු පෙරබාහුවේ නැමෙන පැත්තේ, මැණික් කටුව සන්ධියට සෙන්ටිමීටර 2ක් පහළින්, එකිනෙකට සමාන්තරව පිහිටි සෙන්ටිමීටර 1 බැගින් වූ සිරීම් තුවාල තුනක් (3 abrasions of 1 cm each, parallel to each other, on the flexor aspect of the right forearm, along the radial edge, 2 cm below the wrist joint).

4. දකුණු මැණික් කටුවෙහි පෘෂ්ඨීය ප්‍රදේශයේ සෙන්ටිමීටර 2ක සිරීම් තුවාලයක් (Abrasion of 2 cm on the dorsal aspect of the right wrist, starting 2 cm to the right of the stylus process of radius and extending 2 cm towards the base of the right thumb).

5. දකුණු මැණික් කටුවෙහි පෘෂ්ඨීය ප්‍රදේශයේ, සන්ධියට සෙන්ටිමීටර 1ක් ඉහළින් පිහිටි සෙන්ටිමීටර 1ක සිරීම් තුවාලයක් (Abrasion of 1 cm on the dorsal aspect of the right wrist, starting 1cm above the wrist joint and extending in the midline).

6. කොන්දේ වම් පස, ශ්‍රෝණි අස්ථියේ පිටුපස ඉහළ ප්‍රදේශයට සෙන්ටිමීටර 3ක් ඉහළින් සහ සෙන්ටිමීටර 2ක් මැදට වන්නට පිහිටි සෙන්ටිමීටර 0.5ක සිරීම් තුවාලයක් (Abrasion of 0.5 cm on the back, left side, 3 cm above and 2 cm medial to the posterior superior iliac spine).

එක්ස්-රේ (X-ray) පරීක්ෂණ ලෙස, වින්දිතයාගේ හිස්කබල සම්බන්ධයෙන් ලබා ගන්නා ලද එක්ස්-රේ (X-ray Skull - AP/Lat- 30223/20416) පරීක්ෂණයට අනුව කිසිදු අසාමාන්‍ය තත්ත්වයක් (No abnormalities) වාර්තා වී නොමැති බව සඳහන් කර ඇත.

ඉහත සඳහන් 1,2,3,4,5,6 යන තුවාල බරපතල නොවන තුවාල ලෙසත්, මොට ආයුධයක් මඟින් එම තුවාල සිදුවී ඇති බවත් සඳහන් කර ඇති අතර, වැඩිදුර පරීක්ෂාව සඳහා අක්ෂි ශල්‍ය වෛද්‍යවරයෙකු වෙත යොමු කර ඇති නමුත් අදාළ වාර්තා සමඟ නැවත අධිකරණ වෛද්‍යවරයා හමුවීමට නොපැමිණි බවත් වැඩිදුරටත් එහි සඳහන් කර ඇත.

<u>වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම</u>

01. පළමුවන වගඋත්තරකරු- ප්‍රධාන පොලිස් පරීක්ෂක වන්දන විදානගමගේ (හිටපු ස්ථානාධිපති - බුලත්සිංහල පොලිස් ස්ථානය)

2025.08.28 දින කොමිෂන් සභාවේ පැවති විමර්ශනයේ දී ප්‍රකාශයක් ලබා දෙමින්, අදාළ සිදුවීම වූ කාලවකවානුවේදී ඔහු බුලත්සිංහල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වශයෙන් රාජකාරි කළ බවත්, මෙම සිදුවීම පිළිබඳව නිශ්චිත මතකයක් නොමැති වුව ද, පැමිණිලිකරුගේ මව තමා මුණගැසී සිය පුත්‍රයාට සිදු වූ අසාධාරණය පිළිබඳව කරුණු ඉදිරිපත් කළ බව සඳහන් කර ඇත. ඒ වන විට සැකකරුට පොලිස් ඇප ලබා දී තිබූ බැවින්, පහරදීම සම්බන්ධයෙන් විධිමත් පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට සැකකරු (වින්දිතයා) තමා වෙත ඉදිරිපත් කරන ලෙස ඇයට උපදෙස් ලබා දුන් නමුත්, පසුව ඔවුන් පොලිසියට පැමිණ පැමිණිල්ලක් ගොනු නොකළ බව සඳහන් කර ඇත. සැකකරු සන්තකයේ නීති විරෝධී මත්පැන් තිබූ බවට අදාළ වැටලීම් නිලධාරීන් වාර්තා කර තිබූ බැවින්, පවතින ලේඛනගත තොරතුරු මත පදනම්ව නියමිත පරිදි අධිකරණයට කරුණු වාර්තා කිරීමට සිදු වූ බවත්, පැමිණිලිකරු පොලිසියට පැමිණ කරුණු දැක්වූයේ නම් ඉහළ නිලධාරීන්ගේ උපදෙස් මත ඒ පිළිබඳව විමර්ශනයක් කළ හැකිව තිබූ බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

02. දෙවන වගඋත්තරකරු- උප පොලිස් පරීක්ෂක කසුන් ගන්කේවල (හිටපු දූෂණ මර්ධන අංශ ස්ථානාධිපති- බුලත්සිංහල පොලිස් ස්ථානය)

2025.08.28 වන දින කොමිෂන් සභාවේ පැවති විමර්ශනයේ දී කරුණු දක්වමින්, 2024.06.16 වන දින තමා තරංග, අනුරුද්ධ සහ ලියනගේ යන සෙසු නිලධාරී කණ්ඩායමක් සමඟ 'යුක්තිය' මෙහෙයුමට අදාළව දූෂණ මර්දන රාජකාරිවල නිරතව සිටි බවත්, එහිදී හල්වතුර දෙසට ධාවනය කරමින් සිටියදී ප්‍රතිවිරුද්ධ දිශාවෙන් හිස් ආවරණ රහිතව පැමිණි යතුරුපැදියක් පරීක්ෂා කිරීමට උත්සාහ කළ අවස්ථාවේදී, එහි සිටි දෙදෙනෙකු පලා ගිය බවත් පැමිණිලිකරු මල්ලක් ද සහිතව එම ස්ථානයේ රැඳී සිටි බවයි. ඔහු සැකකරු අසලට යද්දී එම පුද්ගලයා පලා යාමට උත්සාහ කළ බැවින්, ඔහුව හඹා ගොස් අත්අඩංගුවට ගැනීමට කටයුතු කළ බව සඳහන් කර ඇත. එහිදී සැකකරු අත්අඩංගුවෙන් මිදී යාමට උත්සාහ කරමින් පොලිසිය සමඟ පොරබැදූ බවත්, ඔහුට අත්විලංගු දැමීමට උත්සාහ කිරීමේදී අත්විලංගුව සැකකරුගේ ඇස ප්‍රදේශයේ වැදුණු බව සඳහන් කර ඇත. අත්අඩංගුවට ගැනීම සඳහා අවශ්‍ය අවම බලය පමණක් භාවිතා කළ බවත්, කිසිදු ආකාරයක පහරදීමක් සිදු නොකළ බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත. එසේම සැකකරු සන්තකයේ තිබූ නීති විරෝධී මත්පැන් (කසිප්පු) මිලිලීටර් 750 ක ප්‍රමාණයක් භාරයට ගෙන පස්වරු 19.ට පමණ පොලිස් ස්ථානයේ උපසේවය වෙත භාර දුන් බවත් සඳහන් කර ඇත.

3. සෙසු වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශයන්

පැමිණිල්ල සම්බන්ධයෙන් පෙනී සිටි පොලිස් කොස්තාපල් (104236) ලියනගේ මහතා ඇතුළු අනෙකුත් නිලධාරීන්, දූෂණ මර්දන අංශයේ රාජකාරිවල නිරත වෙමින් විවිධ වැටලීම් සහ අත්අඩංගුවට ගැනීම් සිදු කළ ද, මෙම සිදුවීමේදී වින්දිතයාට පහරදුන් බවක් නොදුටු බව සඳහන් කර ඇත. පැමිණිලිකරු විසින් ද පහරදීමට සම්බන්ධ වූ පුද්ගලයා ලෙස ඍජුවම නම් කර ඇත්තේ දෙවන වගඋත්තරකාර කසුන් නමැති නිලධාරියා පමණක් වන බැවින්, සෙසු නිලධාරීන් පහරදීමක් සිදුනොකල බව සඳහන් කර ඇත.

<u>නිරීක්ෂණ -</u>

01. පැමිණිල්ල මඟින්, 2024.06.16 වන දින බුලත්සිංහල පොලිස් ස්ථානයට අනුයුක්තව සිවිල් ඇඳුමින් සිටි 'කසුන්' නැමැති නිලධාරියා ඇතුළු පිරිසක් විසින් පැමිණිලිකරුව අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගත් බවත් එම අවස්ථාවේදී අසභ්‍ය වචනයෙන් බැණ වදිමින් කසුන් නිලධාරියා හෙල්මට් එකකින් සහ අතින් පයින් පහර දී ඇති බවත්, පොලිස් ස්ථානය තුළදී ක්‍රිකට් පිත්තක් භාවිතා කරමින් දණගස්වා පිටට සහ

යටිපතුල්වලට පහර දීම හේතුවෙන් පැමිණිලිකරුගේ වම් ඇසට සහ ශරීරයේ ස්ථාන කිහිපයකට බරපතල තුවාල සිදු වී ඇති බවත්, ඒ සම්බන්ධයෙන් ඔහු හොරණ මූලික රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබා ඇති බවත් සඳහන් කර ඇත.

02. සිද්ධිය ඇසින් දුටු ස්වාධීන සාක්ෂිකරුවකු වන මානගේ පියසෝම රත්නසිරි යන අය විසින් ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශය මගින්, 2024.06.16 වන දින සිය කඩ කාමරය අසලදී වින්දිත ඉෂාන් තිලකරත්න යන අයව පුද්ගලයන් දෙදෙනෙකු විසින් බිත්තියට හේත්තු කර අතින් පයින් සහ හෙල්මට් එකකින් අමානුෂික ලෙස පහර දෙනු තමා දුටු බවත්, එම පුද්ගලයන් තමන් "පොලීසියෙන්" බව හඳුන්වා දුන් බවත්, පහරදීමෙන් අනතුරුව වින්දිතයාට අත්විලංගු දමා යතුරුපැදියක නංවාගෙන රැගෙන ගිය බවත් ප්‍රකාශ කර ඇත.

03. මෙම සිද්ධිය සම්බන්ධයෙන් ඇසින් දුටු ස්වාධීන සාක්ෂිකරුවකු වන රේණුකා මල්කාන්ති යන අය විසින් ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශය මගින්, 2024.06.16 වන දින ඇය සිය දරුවාට ඖෂධ ලබාගැනීමෙන් පසු කෝන්ගස්තැන්න හන්දියට පැමිණ සිටි අවස්ථාවේදී, බුලත්සිංහල පොලිස් ස්ථානයට අනුයුක්තව සේවය කරන, සිවිල් ඇඳුමින් සැරසී සිටි උප පොලිස් පරීක්ෂක කසුන් නැමැති නිලධාරියා විසින් ඉෂාන් තිලකරත්න යන අයට අමානුෂික ලෙස පහර දෙන ආකාරය සියැසින් දුටු බවත්, අදාළ පහරදීමට හේතුව විමසූ අවස්ථාවේදී එම නිලධාරියා ඒ පිළිබඳ කිසිදු කරුණු දැක්වීමක් සිදු නොකළ බවත්, අනතුරුව වින්දිතයාව අනාරක්ෂිත අයුරින් යතුරුපැදියක රඳවාගෙන රැගෙන ගිය බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

04. වින්දිතයාගේ මව වන මානගේ රේණුකා ප්‍රියන්ති මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයට අනුව, යතුරු පැදියේ නැගී ආ පුද්ගලයන්ගෙන් එක් අයකු වන මහතුන් යන අය තමාට පැමිණ පොලීසිය විසින් ඉෂාන්ට පහර දෙන බව සඳහන් කළ බවත්, තමා පහර දෙන ස්ථානයට යන අවස්ථාවේ දී මාංචු දමා රැගෙන යන අයුරු දුටු බවත් පසුව, රාත්‍රී 09.00 ට පමණ ඇය බුලත්සිංහල පොලිස් ස්ථානය වෙත ගිය අවස්ථාවේදී, වින්දිතයා බැලීමට අවස්ථාව ලබා නොදුන් බවත් ඒ හේතුවෙනක් කෑ ගැසීමෙන් පසුව ලද අවස්ථාවේ දී වින්දිතයා පහරදීමකට ලක්ව සිටිනු ඇය දුටු බවත්, පහරදීම හේතුවෙන් වින්දිතයාගේ වම් ඇස විවෘත කිරීමට පවා නොහැකි වන පරිදි තුවාල වී තිබූ බවත්, පසුදින ඇප ලබා දීමෙන් පසුව ඔහුට තනිවම ඇවිද යාමට පවා නොහැකි මට්ටමේ දැඩි ශාරීරික අපහසුතාවයකින් සිටි බවත් සඳහන් කර ඇත.

05. වින්දිතයාගේ මව සිය පුත්‍රයා බැලීමට පොලිස් ස්ථානයට ගිය අවස්ථාවේදී, දෙවන වගඋත්තරකාර කසුන් නමැති නිලධාරියා ඇයව එලවා ගනිමින් බැණ වැදී ඇති බවත්, පසුව ඇයගේ දැඩි ඉල්ලීම හා කෑගැසීම මත වෙනත් නිලධාරියෙකු මැදිහත් වී ඇයට වින්දිතයාව බැලීමට අවස්ථාව ලබා දී ඇති බවත් නිරීක්ෂණය වේ. මෙය පොලිස් භාරයේ සිටින රැඳවියකුගේ ඥාතීන්ට පවතින නීත්‍යානුකූල අයිතිවාසිකම් අත්තනෝමතික ලෙස සීමා කිරීමක් මෙන්ම, වගඋත්තරකාර නිලධාරීන් වින්දිත පාර්ශවය කෙරෙහි දැක්වූ පීඩාකාරී හැසිරීම මනාව පිළිඹිබු කරන්නකි.

06. වින්දිතයා, සිද්ධිය ඇසින් දුටු සාක්ෂිකරුවන් දෙදෙනකු සහ වින්දිතයාගේ මව ලබා දී ඇති දිවුරුම් ප්‍රකාශයන්හි සිද්ධිය සිදු වූ ස්ථානය (කෝන්ගස්තැන්න හන්දිය), පහරදීමට භාවිතා කළ උපකරණ (හෙල්මට් එක සහ අත් පයින් පහරදීම) සහ වින්දිතයා පොලිසියට රැගෙන ගිය ආකාරය පිළිබඳව පූර්ණ සමානතාවයක් දක්නට ලැබේ. මෙම සාක්ෂි තුළ පවතින අනුකූලතාවය සැලකිල්ලට ගැනීමේදී, වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක කසුන් නිලධාරියා විසින් වින්දිතයාට පහර දී ඇති බවට වන චෝදනාව තහවුරු වන බව නිරීක්ෂණය වේ.

07. වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක කසුන් විසින් 2025.08.28 වන දින කොමිෂන් සභාව වෙත ලබා දෙන ලද ප්‍රකාශයට අනුව, වින්දිතයා හිස්වැසුම් රහිතව යතුරුපැදියක පැමිණ ඇති බවත්, එහි සිටි සෙසු දෙදෙනා පලා ගොස් ඇති බවත් සඳහන් වේ. වින්දිතයා අත්අඩංගුවට ගැනීමට යාමේදී ඔහු දැක්වූ ප්‍රතිරෝධය හමුවේ අත්විලංගුව ඔහුගේ ඇස ප්‍රදේශයේ වැදුණු බවත්, ඒ සඳහා අවම බලය භාවිතා කළ බවත් වගඋත්තරකරු වැඩිදුරටත් සඳහන් කර ඇත. මෙම ප්‍රකාශය වින්දිතයා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශය සමඟ යම් ප්‍රමාණයක අනුකූලතාවයක් නිරීක්ෂණය වුවද, බුලත්සිංහල පොලිස් ස්ථානයේ දූෂණ මර්දන වැටලීම් තොරතුරු පොතේ (IB) සටහන් කර ඇති කරුණු ඒ හා පරස්පර වන බව නිරීක්ෂණය වේ.

එම තොරතුරු පොතේ වාර්තා කර ඇත්තේ, යතුරුපැදියක පසුපස පැමිණි අයෙකු වගඋත්තරකරුවන් දැක යතුරුපැදියෙන් බැස පයින් පැමිණෙන අවස්ථාවේදී පොලිසිය දැක දිව යාමට උත්සාහ කළ බවයි. අනතුරුව පො.කො. 102191 තරංග යන නිලධාරියා සමඟ ඔහු පරීක්ෂා කළ අවස්ථාවේදී අතේ තිබූ බෑගයක නීති විරෝධී මත්පැන් වීදුරු බෝතලයක් තිබූ බව එහි සඳහන් වේ.

08. බුලත්සිංහල පොලිස් ස්ථානයේ දූෂණ මර්දන වැටලීම් තොරතුරු පොතෙහි (IB) 2024.06.16 වන දිනැති පිටුව 216, ඡේදය 123 හි දෙවන වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක කසුන් විසින් තබන ලද සටහනට අනුව, වින්දිතයාගේ දකුණු අතෙහි සිරීම් තුවාල පවතින බවත්, එම තුවාලවලින් ලේ නොගලන බවත් සඳහන් කර ඇති බව නිරීක්ෂණය වේ.

එසේම, එම තොරතුරු පොතේම 2024.06.17 වන දිනැති පිටුව 226, ඡේදය 131 හි වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක කසුන් විසින් තබන ලද සටහන මගින් දක්වා ඇත්තේ, වින්දිතයා අත්අඩංගුවට ගැනීමේදී සිදු වූ දැඟලීම (ප්‍රතිරෝධය) හේතුවෙන් අත්විලංගුවේ කොටසක් ඔහුගේ මුහුණේ වැදුණු බවත්, දැඩි පරිශ්‍රමයක් දරා වින්දිතයාව අත්අඩංගුවට ගත් බවත්ය. එම සටහනට අනුව වින්දිතයාගේ වම් ඇස අසල සහ දකුණු අතේ අත්විලංගු කොටස වැදී රතු වී ඇති බවත්, ශරීරයේ වෙනත් තුවාල නොමැති බවත් සඳහන් කර ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

09. දෙවන වගඋත්තරකරු කොමිෂන් සභාව වෙත ලබාදුන් ප්‍රකාශය මගින් වින්දිතයා හිස්වැසුම් රහිතව යතුරුපැදියක පැමිණි බවත්, එහි සිටි සෙසු දෙදෙනා පලා ගිය බවත් සඳහන් කර ඇත. එහෙත්, පොලිස් තොරතුරු පොතේ (IB) සටහන් වී ඇත්තේ යතුරුපැදියක පසුපස පැමිණි අයෙකු නිලධාරීන් දැක යතුරුපැදියෙන් බැස "පයින් එන අවස්ථාවේදී" ඔහුව පරීක්ෂා කිරීමට උත්සාහ කළ බවයි. වගඋත්තරකරු පවසන "යතුරුපැදියේ සිටියදී අත්අඩංගුවට ගැනීමට යාම" සහ නිල සටහන්වල ඇති "පයින් එන පුද්ගලයෙකු පරීක්ෂා කිරීම" යන කරුණු අතර පරස්පරතාවක් පවතී. එසේම, 2024.06.16 දිනැති තොරතුරු පොතේ මුල් සටහනට අනුව (පිටුව 216, ඡේදය 123), වින්දිතයාගේ දකුණු අතේ සිරීම් තුවාල පමණක් පවතින බවත්, රුධිරය වහනය නොවන බවත් සඳහන් කර ඇත. එම අවස්ථාවේදී වින්දිතයාගේ ඇසට සිදු වූ තුවාලයක් පිළිබඳව කිසිදු සඳහනක් කර නොමැත. එහෙත්, වින්දිතයා පොලිස් භාරයේ සිටියදී පසුදින, එනම් 2024.06.17 වන දින තබන ලද සටහනේ (පිටුව 226, ඡේදය 131) වින්දිතයා අත්අඩංගුවට ගැනීමේදී සිදු වූ දැඟලීමක් නිසා අත්විලංගු වැදී ඇස අසල රතු වී ඇති බවට තොරතුරු එක් කර ඇති බව නිරීක්ෂණය වේ.

10. වින්දිතයා විසින් ලබාදී ප්‍රකාශයේ, කෝන්ගස්තැන්න හන්දියේදී ඔහුට අතුල් පහරවල් සහ හෙල්මට් එකකින් මුහුණට පහර දුන් බවත්, පසුව පොලිස් ස්ථානය තුළදී ලී ක්‍රිකට් පිත්තකින් පිට ප්‍රදේශයට සහ යටිපතුල්වලට පහර දුන් බවත් සඳහන් වන අතර, මෙම ප්‍රකාශය තහවුරු කිරීම සඳහා අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් වින්දිතයාගේ වම් ඇසෙහි අක්ෂි පටලයට යටින් සිදු වූ රුධිර වහනය සහ වම් ඇසට පහළින් වූ තැලීම් තුවාලය, ඔහු පවසන පරිදි හෙල්මට් එකකින් සහ අතින් එල්ල කළ පහරවල් සමඟ සැසඳෙන බව නිරීක්ෂණය වේ. එසේම, දෙවන වගඋත්තරකරු පවසන පරිදි "අත්විලංගු

දැමීමේදී සිදු වූ පොරබැදීමක්" මගින් අක්ෂි පටලයට යටින් රුධිරය වහනය වන මට්ටමේ හානියක් සිදුවීම තාර්කිකව පිළිගැනීමේ හැකියාවක් නොමැති බව පෙනීයයි.

වෛද්‍ය වාර්තාවේ 03, 04 සහ 05 යන තුවාල ලෙස දක්වා ඇති දකුණු පෙරබාහුවේ සහ මැණික් කටුව ආශ්‍රිත සිරීම් තුවාල මගින් වින්දිතයාට අත්විලංගු දැමීම සහ එම අවස්ථාවේ සිදු වූ ක්‍රියාවලිය සනාථ වන අතරම, කොන්දේ වම් පස නිරීක්ෂණය වූ සිරීම් තුවාලය (තුවාල අංක 06), වින්දිතයා පවසන පරිදි ක්‍රිකට් පිත්තකින් හෝ මොට ආයුධයකින් සිදුකළ පහරදීමකට අනුකූල වන බව අධිකරණ වෛද්‍ය නිලධාරියා සිය මතය මගින් තහවුරු කර ඇති බව නිරීක්ෂණය වේ.

11. සිද්ධිය ඇසින් දුටු ස්වාධීන සාක්ෂිකරුවකු වන මානගේ පියසෝම රත්නසිරි යන අය සිය දිවුරුම් ප්‍රකාශය මගින්, වින්දිතයාව බිත්තියට හේත්තු කර හෙල්මට් එකකින් සහ අතින් පයින් අමානුෂික ලෙස පහර දෙනු තමා දුටු බවත්, රේණුකා මල්කාන්ති යන ස්වාධීන සාක්ෂිකාරිය ද උ.පො.ප කසුන් වින්දිතට අමානුෂික ලෙස පහර දෙනු සියසින් දුටු බවට සඳහන් කර ඇත. මෙම සාක්ෂි වින්දිතයාගේ ප්‍රකාශය තවදුරටත් සනාථ කරන අතර, වගඋත්තරකාර නිලධාරීන් සිය නිල බලය අනිසි ලෙස භාවිතා කරමින් නීතියෙන් පරිබාහිරව කටයුතු කර ඇති බව මෙයින් මනාව පැහැදිලි වේ.

12. වින්දිතයාව අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඔහුට ඊට අදාළ හේතුව පැහැදිලි කර නොමැති අතර, "පොලිසියේදී දැනගන්න පුළුවන්" යනුවෙන් පවසා අත්අඩංගුවට ගෙන ඇත. මෙය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) වගන්තිය මගින් පනවා ඇති ව්‍යවස්ථාපිත පටිපාටිය උල්ලංඝනය කිරීමකි.

13. වින්දිතයාගේ මව පොලිස් ස්ථානයට පැමිණි අවස්ථාවේදී, ස්ථානාධිපතිවරයා විසින් "නඩු පවරන්නේ නැති බව" පවසා ඇයව සහ වින්දිතයාව දැනුවත් කර තිබුණද, ඔහු විසින්ම 2024.08.18 දිනැතිව ඉදිරිපත් කරන ලද වාර්තාව මගින්, 2024.06.16 දින අත්අඩංගුවට ගත් වින්දිතයාට එරෙහිව නීති විරෝධී මත්පැන් මිලි ලීටර් 750ක් සන්තකයේ තබා ගැනීමේ චෝදනාව මත 2024.07.03 දින මතුගම මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 10952/24 යටතේ චෝදනා පත්‍ර ගොනු කර ඇති බව නිරීක්ෂණය වේ.

14. ශාරීරික අපහසුතාවයකින් සහ වේදනාවකින් පසු වූ තත්ත්වයක පසුවන සැකකරුවෙකු සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී, වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීමේ වගකීම පොලිසිය සතු වුවද, වගඋත්තරකරුවන් විසින් ඔහුව සිරමැදිරිය තුළ රඳවා තබා ගැනීමට කටයුතු කර ඇත. මෙය රෝගී හෝ තුවාල ලැබූ සැකකරුවන්ගේ රැකවරණය සහ සුභසාධනය සම්බන්ධයෙන් වන පොලිස් දෙපාර්තමේන්තු නියෝග (A20) පැහැර හැරීමක් ලෙස නිරීක්ෂණය වේ.

15. <u>*අමල් සුදත් සිල්වා එ.පො.ප කොඩිතුවක්කු නඩුව මෙන්ම ඩිල්ෂාන් තිලකරත්න සහ වයි කුමාරිහාමි එ.සාජන් ඩග්ලස් ඇල්ලේපොල සමග වෙනත් අය* **(SCFR 578/2011)**</u> නඩුවේදී පුද්ගලික නිදහස සහ ආරක්ෂාව පිළිබඳ නිදහස සහ ආරක්ෂාව පිළිබඳව ව්‍යවස්ථාමය සහතිකය භුක්ති විදිමට අයිතිය තිබිය යුතු අතර, සුප්‍රකට හෝ දරුණු අපරාධකරුවන් පවා වධහිංසාවට අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඩුවම් වලට ලක් නොවීමේ අයිතිය නීතිය අනුව පවතින බව දක්වා ඇත.

16. <u>*බන්දුල සමරසේකර එදිරිව. විජිත අල්විස්, ඕ.අයි.සී ගිනිගතේන පොලිස් ස්ථානය* **(S.C(FR) 107/2007)**</u> නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දුන්නේ, පොලිස් නිලධාරියෙකුගේ ප්‍රධානතම යුතුකම වන්නේ සියලු අපරාධ සහ මහජන පීඩා වැළැක්වීමට සහ මහජන සාමය ආරක්ෂා කිරීමට සිය උපරිම ශක්තිය යෙදවීම බවයි. සිය රාජකාරිය ඵලදායී ලෙස ඉටු කිරීමට නම් මහජන විශ්වාසය සහ ගෞරවය දිනාගත යුතු අතර, ඒ සඳහා සාමාන්‍ය පුද්ගලයෙකුගෙන් බලාපොරොත්තු වනවාට වඩා උසස්

සදාචාරාත්මක හා සංස්කෘතික වටිනාකමක් පොලිස් නිලධාරියෙකු සතු විය යුතු බව එහිදී වැඩිදුරටත් දක්වා ඇත.

17. තමන් යටතේ සිටින නිලධාරීන් නීතියට අනුව කටයුතු කරන්නේ දැයි අධීක්ෂණය කිරීමට උසස් නිලධාරීන්ට යුතු කමක් ඇති බවත්, තම අධික්ෂණයට යටත් වන නිලධාරීන්ගේ හැසිරීම සියුම් ලෙස නිරීක්ෂණය කිරීම ඔවුන්ගේ යුතුකමක් බවත්, යටත් නිලධාරීන් මූලික අයිතිවාසිකම් කඩ කරද්දී ඔවුන්ව වගවීමකට ලක් නොකරන උසස් නිලධාරීන්ද එම මූලික අයිතිවාසිකම් කඩ කිරීමට වගකිව යුතු බවත්, වගවීමකට යටත් නොකිරීම මගින් දණ්ඩ මුක්තියේ පරිසරයක් ඇති කරන බවත්, එවැනි නිලධාරීන්ට විනය පියවර නොගැනීම මගින් නීතිය ඉදිරියේ සමානව සැලකීම උල්ලංඝනය කිරීමක් බවත් තුරෙයි රාජා විනිසුරුතුමා විසින් ***<u>ආර්.ඒ.ඉරේෂා ලක්මාලි එ. නෙවිල් සිල්වා, කොළඹ අපරාධ කොට්ඨාශය තවත් කොට්ඨාශය හ 45 අය (SCFR/505/19)</u>*** නඩුවේ දී දක්වා ඇත.

18. ***<u>ගනේෂන් සැම්සන් රෝයි. එදිරිව - එම්.එම්,ජනකු මාරසිංහ. ස්ථානාධිපති අපරාධ විමර්ශන දෙපාරතමේන්තුව SCFR 405/2018</u>*** නඩුවේදී ද දක්වා ඇත්තේ චෝදනාව විශ්වාස කළ හැකි බවට මතයක් ගොඩනගා නොගෙන, ලැබුණු පැමිණිල්ලක් මතම යාන්ත්‍රිකව අත්අඩංගුවට ගැනීමක් පොලිස් නිලධාරීන්ට කල නොහැකි බවත්, පැමිණිල්ල විශ්වාස කල හැකිද නැතහොත් ලබා දී ඇති තොරතුරු විශ්වාසදායකද යන්න තහවුරු කර ගැනීමට කරුණු පැහැදිලි නම් මිස අවශ්‍ය විමර්ශන සිදු කිරීමට පොලිස් නිලධාරීන් ක්‍රියාත්මක විය යුතු බවයි.

නිගමනය

ඉහත සාක්ෂි සහ අධිකරණ වෛද්‍ය වාර්තාව මත පදනම්ව, දෙවන වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක කසුන් ගන්කේවල විසින් වින්දිත ඉෂාන් තිලකරත්න හට පහර දී ශාරීරික හා මානසික වධහිංසා පමුණුවා ඇති බවත්, එමගින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය මගින් සහතික කර ඇති "වධහිංසාවලින් නිදහස් වීමේ අයිතිවාසිකම" උල්ලංඝනය කර ඇති බවත් නිගමනය කරමි.

කිසිදු නීත්‍යානුකූල පදනමකින් තොරව සහ පවතින නෛතික පටිපාටිය උල්ලංඝනය කරමින් වින්දිත ඒ.අයි. තිලකරත්න අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම තුළින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) සහ 13(2) වගන්ති මගින් සහතික කර ඇති "පුද්ගල නිදහස සහ අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමෙන් හා රඳවා තබා ගැනීමෙන් නිදහස් වීමේ අයිතිය" දෙවන වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක කසුන් ගන්කේවල විසින් උල්ලංඝනය කර ඇති බව නිගමනය කරමි. වින්දිතයා අසනීප තත්ත්වයෙන් සිටියදී ඔහුට වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම හිතාමතා පැහැර හැරීම මගින් වගඋත්තරකරු සිය ව්‍යවස්ථාපිත වගකීම ද පැහැර හැර ඇත.

නිර්දේශ

01. ඒ.අයි. තිලකරත්න වින්දිතයාගේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම වෙනුවෙන් දෙවන වගඋත්තරකාර කසුන් ගන්කේවල විසින් වින්දිතයා වෙත රුපියල් රුපියල් ලක්ෂයක (රු.100,000.00) මුදලක් මුදල් ඇණවුමක් මාර්ගයෙන් ගෙවිය යුතුය.

02. වින්දිතයාට වධහිංසා පැමිණවීම, නීත්‍යානුකූල නොවන ලෙස අත්අඩංගුවට ගැනීම හා රඳවා තබා ගැනීම සම්බන්ධව දෙවන වගඋත්තරකරුට එරෙහිව සුදුසු පියවර පොලිස්පතිවරයා විසින් ගත යුතුය.

2026. 11 . 18 දින පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මකවීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත - 1. අමාත්‍යතුමා,
ආරක්ෂක අමාත්‍යාංශය,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ. - කරුණු දැන ගැනීම සඳහා

2.පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 02. - නිර්දේශ ප්‍රකාරය සුදුසු පියවර ගැනීම සඳහා